සැ. යු. - 2017.03.31 වැනි දින පළ වූ අංක 2013 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,014- 2017 අප්‍රේල් මස 07 වැනි සිකුරාදා - 2017.04.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 684 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 692 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 695 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 697 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 702 |


සැ. යු. -(i) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 මාර්තු මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) විදේශ විනිමය පනත් කෙටුම්පත 2017 මාර්තු මස 24 වැනි දින, *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 අප්‍රේල් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රේල් මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ උතුරු දිස්ත්‍රික්කය සඳහා දුම්රිය පීලි අතරට යොදන කුඩා ගල් කියුබ් 2800 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන් වෙත දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් 2017.05.04 වැනි දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු ඇගයීමට ලක්කොට පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රදානය කරනු ලැබේ.

| *අයිතම අංකය* | *ස්ථානය* | *කියුබ්* | *ගෙනැවිත් භාර දිය යුතු කාල සීමාව* |
|---|---|---|---|
| 1. | පූනාව අංගනය | 300 | මාස 02 යි |
| 2. | තාන්ඩිකුලම් අංගනය | 500 | මාස 03 යි |
| 3. | 164m.10ch (වව්නියාව - ඕමාන්තායි අතර) | 1000 | මාස 05 යි |
| 4. | ඕමාන්තායි අංගනය | 1000 | මාස 05 යි |

02. ආපසු ගෙවනු නොලබන රු. 5,000.00 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තු ගෙවීමෙන් අනතුරුව 2017.05.03 දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2017.05.04 වැනි දින ප. ව. 2.00 ට අවසන් කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 94(11) 2438078 /94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7463

04-102

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

පහළ දිස්ත්‍රික්කය සඳහා දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් කියුබ් 1,700ක් ප්‍රසම්පාදනය කිරීම

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන් වෙත දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු ඇගයීමට ලක්කොට පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රදානය කරනු ලැබේ.

| *ස්ථානය* | *කියුබ්* | *ගෙනැවිත් භාර දිය යුතු කාලය (මාස)* |
|---|---|---|
| 1. අංක 1 දුම්රිය නැවතුම් පොළ සහ උතුරු කළුතර දුම්රිය ස්ථාන අතර | 1000 | 06 |
| 2. උතුරු කළුතර දුම්රිය ස්ථාන සහ දකුණු කළුතර දුම්රිය ස්ථාන අතර | 500 | 03 |
| 3. දකුණු කළුතර දුම්රිය ගබඩා ප්‍රදේශය | 200 | 02 |

02. ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2017.04.26 වැනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2017.04.27 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

දුරකතන අංක : 94(11) 2438078/94(11) 2436818
ෆැක්ස් අංකය : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7472

04-103/1

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඇණ මුරිච්චි 56,000 ක් හා ස්ප්‍රිං වොෂර් 100,000 ක් ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : .SRS/F. 7447.

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ඇණ මුරිච්චි 56,000 ක් හා ස්ප්‍රිං වොෂර් 100,000 ක් ප්‍රසම්පාදනය සඳහා දේශීය නිෂ්පාදකයින් වෙතින්, මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාර ගැනීම 2017.05.03 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

03. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලෙන්, 2017.05.02 වැනි දින පස්වරු 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවන ගාස්තුව රුපියල් 4,000 ක් ගෙවිය යුතුය.

04. මෙම ඇණ මුරිච්චි හා ස්ප්‍රිං වොෂර් නිෂ්පාදනය ගැණුම්කරු හට පිළිගත හැකි, ISO 9001:2008 හෝ සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ පද්ධති ප්‍රමිතිලත් ආයතන විසින් කළ යුතුය.

05. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

06. මුද්‍රා තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාර දීමෙන් ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
තැ. පෙ. 1347,
ඕල්කොට් මාවත, කොළඹ 10.

07. දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ලංසු ලේඛන නොමිලේ පරීක්ෂාකොට බැලිය හැකි අතර වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් පරිදි ලබාගත හැකිය :

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 94(11) 2438078 හෝ 94(11) 2436818 |
| ෆැක්ස් | : | 94(11) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F, 7447

04-101/1

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**2017 -2018 වර්ෂය සඳහා බර කිරීමේ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් පත්කිරීම**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් දුම්රිය සේවය සඳහා 2017 -2018 වර්ෂය සඳහා, බර කිරීමේ කාර්ය ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් පත්කිරීම පිණිස, ප්‍රසිද්ධ සංවිධාන වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාර ගැනීම 2017.04.28 වැනි දින ප.ව. 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක් ගෙවීමෙන් , 2017.04.27 වැනි දින පස්වරු 3.00 දක්වා කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් පමණක් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාර ගැනීමේ අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තබන ලද ලංසු, ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දීමෙන් පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී, ලංසු ලේඛන නොමිලයේ පරික්ෂා කොට බැලිය හැක. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

| | | |
|---|---|---|
| දුරකතන අංක | : | 94(11) 2438078 හෝ 94(11) 2436818 |
| ෆැක්ස් | : | 94(11) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |

සභාපති,
දෙපාර්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7437

04-101/2

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ තෝරාගත් දුම්රිය ඇන්ජිම් සඳහා සිද්ධීන් පටිගත කිරීමේ පද්ධතියක් (Event Recorder System) සහ සුපරීක්ෂාකාරී පාලන පද්ධතියක් (Vigilance Control System) සැලසුම් කොට, නිෂ්පාදනය කොට, ස්ථාපනය කොට ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7253

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දුම්රිය සේවය සඳහා සිද්ධීන් පටිගත කිරීමේ පද්ධතියක් හා සුපරීක්ෂාකාරී පාලන පද්ධතියක්

සැලැසුම් කිරීම, නිෂ්පාදනය කිරීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කොට පෙන්වීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් සහ අනෙකුත් හැකියාව සහිත සංවිධානවලින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාර ගැනීම 2017.05.31 වැනි දින ප.ව. 2.00ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ශ්‍රී ලංකා රුපියල් විසි දහසක (රු. 20,000.00) ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.03.21 වැනි දින සිට 2017.05.30 වැනි දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සහ ප. ව. 3.00 අතර ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් ලංසු ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘතිවල ලංසු ඉදිරිපත් කළ යුතුයි. විදේශීය ලංසුකරුවන් එම කාලසීමාව තුළදී ශ්‍රී ලංකා රුපියල් විසි දහසකට (රු.20,000.00) සමාන මුදලක් පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් එතෙර ශ්‍රී ලංකා දූත කාර්යාල වෙත ගෙවා ලංසු ලිපිලේඛන එවන මෙන් ශ්‍රී ලංකා දූත කාර්යාල මගින් ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී වෙතින් ඉල්ලීමක් කළ හැක. ශ්‍රී ලංකා රුපියල් විසි දහස (රු. 20,000.00) වන ප්‍රසම්පාදන ගාස්තුව (හෝ පරිවර්තන කළ හැකි සමාන වටිනා කමැති විදේශ මුදල් වර්ගය) ආපසු ගෙවනු නොලැබේ.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍ර තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347
ඕල්කොට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.

දුරකතන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7253

04-94

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීමයි

EN 45 E1 දුම්රිය මාර්ගයට සුදුසු වන පරිදි දුම්රිය ස්ථාන දෙක ඇතුළුව කන්තලේ සහ තම්පලාගමුව දුම්රිය ස්ථාන දෙක අතර යෙදීම සඳහා කොන්ක්‍රීට් සිල්පරම් කොට 8000ක් සැපයීම් සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7475

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දුම්රිය ස්ථාන දෙක ඇතුළුව කන්තලේ සහ තම්පලාගමුව දුම්රිය ස්ථාන අතර යෙදීම් සඳහා කොන්ක්‍රීට් සිල්පරම් කොට 8000ක් මිලදී ගැනීම සඳහා දේශීය නිෂ්පාදකයන්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.05.05 වැනි දින ප.ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු 15,200.00 ක ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.03.21 වැනි දින සිට 2017.05.04 වැනි දින දක්වා සාමාන්‍ය රාජකාරී දිනයන්හි 9.00 පැය හා 15.00 පැය අතර, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට මාවත දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍ර තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

දුරකථන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818
ෆැක්ස් : 94(11) 2432044.
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංකය : SRS/F. 7475

සභාපති,
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-95

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ගල්ඔය හා පොළොන්නරුව දුම්රිය ස්ථාන අතර (එම දුම්රිය ස්ථාන ද ඇතුළත්ව) මාර්ගය සඳහා, EN 45 E1 රේල් සීට් සඳහා ගැළපෙන කොන්ක්‍රීට් සිල්පර 5,000 ක් සැපයීම් සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7474

01. ශ්‍රී ලංකාවේ, කෙළඹ 10, ඕල්කට් මාවතේ තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, ගල්ඔය හා පොළොන්නරුව දුම්රිය ස්ථාන අතර (එම දුම්රිය ස්ථාන ද ඇතුළත්ව) මාර්ගය සඳහා කොන්ක්‍රීට් සිල්පර 5,000 ක් සැපයීම සඳහා දේශීය නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍ර තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.04.25 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) පස්වරු 2.00 ට අවසන් කරනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු රුපියල් 11,500.00ක් ගෙවීමෙන් 2017.03.20 දින සිට 2017.04.24 වැනි දින දක්වා, සමාන්‍ය රාජකාරි දිනවල 0900 පැය හා 1500 පැය අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන්හට හෝ ඔවුන්ගේ බලය පැවරූ නියෝජිතයන් හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍ර තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ඒ සඳහා තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන් හෝ ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර පහත සඳහන් අය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1347,
ඕල්කට් මාවත,
කොළඹ 10.

දුරකතන අංක : 94(11) 2438078 හෝ 94(11) 2436818 ,
ෆැක්ක් අංකය : 94(11) 2432044,
ඊමේල් : srs.slr@gmail.com

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F. 7474

04-96

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීමයි

### රුමේනියානු දුම්රිය මැදිරි සඳහා LOW FRICTION COMPOSITE BRAKE BLOCKS 12,000 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7465

01. ශ්‍රී ලංකාව, කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත LOW FRICTION COMPOSITE BRAKE BLOCKS 12,000 ක් සැපයීම් සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍ර තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින් තම ලංසු ඇටෝර්නි බලය මගින් බලය පවරන ලද බලයලත් ඒජන්ත කෙනකු මගින් ඉදිරිපත් කළ හැකිය.

02. ලංසු භාරගැනීම 2017.05.30 වෙනි දින ප.ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 4,000.00 ක් පමණක් වන ප්‍රසම්පාදන ගාස්තුව ශ්‍රී ලංකා මුදලින් හෝ පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදල් වර්ගයකින් සමාන වටිනාකමකින් යුත් මුදලක් ගෙවීමෙන් අනතුරුව 2017.05.29 වෙනි දින ප.ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ එතෙර ශ්‍රී ලංකා දූත කාර්යාලවලින් ලබාගත හැකි ලංසු ලිපිලේඛනවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10 ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍ර තබන ලද ලංසු, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනැවිත් භාර දිය හැක.

සභාපති,<br>
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය,<br>
දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය,<br>
ඕල්කොට් මාවත, කොළඹ 10. ශ්‍රී ලංකාව

06. ශ්‍රී ලංකා කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තුමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලිපිලේඛන නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,<br>
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,<br>
තැ.පෙ. 1347,<br>
ඕල්කොට් මාවත,<br>
කොළඹ 10, ශ්‍රී ලංකාව.

| | | |
|---|---|---|
| දුරකථන අංක | : | 94(11) 2438078 හෝ 94(11) 2436818 |
| ෆැක්ස් | : | 94(11) 2432044 |
| ඊමේල් | : | srs.slr@gmail.com |
| වෙබ් අඩවිය | : | www.railway.gov.lk |
| යොමු අංකය | : | SRS/F. 7465 |

සභාපති<br>
දෙපාර්තුමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ)<br>
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-97

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීමයි

### ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කොළඹ අංගනයේ සහ රත්මලාන අංගනයේ ඇති යකඩ යතු කුඩු (Iron Shavings) මිලදී ගෙන ඉවත් කිරීම

ප්‍රසම්පාදන අංකයː SRS/F.7462

01. ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කොට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් වසරක කාලයක් පුරා දුම්රිය කොළඹ අංගනයේ සහ රත්මලාන අංගනයේ එකතු වූ යකඩ යතු කුඩු මිලදී ගෙන ඉවත්කර ගැනීම සඳහා මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම (ශ්‍රී ලංකා වේලාවෙන්) 2017.04.21 වෙනි දින ප.ව. 2.00ට අවසාන කරනු ලැබේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක් (රුපියල් තුන්දහසක්) පමණක් වන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.04.20 වෙනි දින ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ.පෙ. 1347,
ඕල්කොට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ:

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10.
ශ්‍රී ලංකාව.
දුරකථන අංකː 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකයː 94(11)2432044
ඊමේල් : srs.sl@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකයː SRS/F.7462

04-105

---

යොමු අංකයː SRS/F.7437

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මාර්ග නඩත්තුව සඳහා Rail Drilling යන්ත්‍ර 25 ක්, Rail Cutting යන්ත්‍ර 25 ක්, Sleeper Boring යන්ත්‍ර 25 ක් සහ Coach Screwing යන්ත්‍ර 10 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

01. ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මාර්ග නඩත්තුව සඳහා Rail Drilling යන්ත්‍ර 25 ක්, Rail Cutting යන්ත්‍ර 25 ක්, Sleeper Boring යන්ත්‍ර 25 ක් සහ Coach Screwing යන්ත්‍ර 10 ක් මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2017.05.26 වෙනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 2.00ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 10,000.00 ක් පමණක් හෝ පහසුවෙන් පරිවර්තනය කළ මුදල් වර්ගයකින් ඒ හා සමාන මුදල ලිපිලේඛන ගාස්තුව වශයෙන් ගෙවීමෙන් අනතුරුව 2017.05.25 වෙනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 3.00 දක්වා ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය හෝ එතෙර ශ්‍රී ලංකා දූත කාර්යාල වෙතින් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවේ පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
තැ.පෙ. 1347,
ඕල්කට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩිදුර විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ:

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංකː 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකයː 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකයː SRS/F.7451

04-104

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩා ගල් කියුබ් 1,850 ක් ප්‍රසම්පාදනය කිරීම**

01. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ (මහා පරිමාණ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් ස්ථානයන් වෙත දුම්රිය පීලි අතරට යොදනු ලබන කුඩාගල් සැපයීම සඳහා සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. මෙම ලංසු ඇගයීමට ලක්කොට පහත සඳහන් එක් එක් අයිතම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රදානය කරනු ලැබේ.

| | *ස්ථානය* | *කියුබ්* | *ගෙනවිත් භාරදිය යුතු කාලය (මාස)* |
|---|---|---|---|
| 1. | CEW අංගනය | 100 | 02 |
| 2. | බුළුගහගොඩ දුම්රිය අංගනය | 50 | 01 |
| 3. | වේයන්ගොඩ 1PW අංශය (19m 22C Dn) | 50 | 01 |
| 4. | වේයන්ගොඩ 1PW අංශය (20m 63C Dn) | 150 | 02 |
| 5. | වේයන්ගොඩ 1PW අංශය (21m 25C Dn) | 50 | 01 |
| 6. | වේයන්ගොඩ 1PW අංශය (22m 40C Up) | 250 | 03 |
| 7. | වේයන්ගොඩ 1PW අංශය (25m 73C Dn) | 200 | 03 |
| 8. | වේයන්ගොඩ 1PW අංශය (25m 73C Up) | 200 | 03 |
| 9. | හලාවත දුම්රිය අංගනය | 300 | 03 |
| 10. | නාත්තන්ඩිය දුම්රිය අංගනය | 250 | 03 |
| 11. | ලුණුවිල දුම්රිය අංගනය | 250 | 03 |

02. ආපසු ගෙවනු නොලබන රු. 3,000.00 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2017.04.25 වෙනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ලංසු භාරගැනීම 2017.04.26 වෙනි දින ප.ව. 2.00ට අවසාන කෙරේ.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට පැමිණ සිටින මෙන් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කිරීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලය,
ඕල්කට් මාවත,
කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේදී නොමිලේ පරීක්ෂා කර බැලිය හැක.

දුරකථන අංක : 94(11)2438078 හෝ 94(11)2436818
ෆැක්ස් අංකය : 94(11)2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මහා පරිමාණ),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය: SRS/F.7468

04-103/2

# බඩු බාහිරාදිය විකිණීම්

සබරගමුව පළාත්බද ඇඹිලිපිටිය මහාධිකරණයේ අවසන් නඩුවලට අදළ නඩු භාණ්ඩ වෙන්දේසි කිරීම

මෙහි පහත උපලේඛනයේ සඳහන් අවසන් නඩුවලට අදළ නඩු භාණ්ඩ 2017.05.03 වැනි බදාදා පෙ. ව. 10.00 ට ඇඹිලිපිටිය මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වෙන්දේසි කිරීමට ප්‍රථම පැය 1/2කට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු වේ.

04. මෙම භාණ්ඩ මිලදී ගන්නා අය මුදල් ගෙවා රිසිට්පත ලබාගෙන මිලදී ගත් භාණ්ඩ එදිනම, අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

05. තවද, එම භාණ්ඩ මිලදී ගන්නා අය ස්වකීය හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර, ගෙවීම් සඳහා චෙක්පත්, මුදල් ඇණවුම් කිසිවක් භාර නොගන්නා බවද, මෙයින් දැනුම් දෙමි.

කුමාරි එම්. අබේරත්න,
මහාධිකරණ විනිසුරු,
සබරගමුව පළාත්බද මහාධිකරණය,
ඇඹිලිපිටිය.

2017 මාර්තු 21 වැනි දින,
ඇඹිලිපිටිය මහාධිකරණයේ දී ය.

වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලේඛනය

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01. | HCE 43/14 (මහේ/අධි/අංක බී ආර්. 348/09) | ත්‍රීරෝද රථයක කික් හැඬලය |
| 02. | HCE 98/13 (මහේ/අධි/අංක 26234/09) | 1. පොඩි කතුරු 01යි<br>2. කළු පටි සහිත අත් ඔරලෝසු 01යි |
| 03. | HCE 90/13 (මහේ/අධි/අංක බී ආර්. 1604/11) | N 91 වර්ගයේ ජංගම දුරකථනය |
| 04. | HCE 81/14 (මහේ/අධි/අංක 89281/13 NS ) | Forme වර්ගයේ ජංගම දුරකථනය |
| 05. | HCE 58/15 (මහේ/අධි/අංක බී ආර්. 662/13) | WPQM 7976 දරන කොළපාට ත්‍රීරෝද රථය |
| 06. | HCE 59/15 (මහේ/අධි/අංක බී ආර්. 1675/13) | SGVH 4051 දරන ඩිස්කවරි යතුරු පැදිය හා ස්විච් යතුර |
| 07. | HCE 76/14 (මහේ/අධි/අංක බී ආර්. 521/14) | NC XK 8617 දරන යතුරු පැදිය (බැටරිය රහිත) |
| 08. | HCE 42/13 (මහේ/අධි/අංක බී ආර්. 264/09) | කැත්තක් |
| 09. | HCE 29/16 (මහේ/අධි/අංක බී ආර්. 606/12) | යකඩ ඉන්නක්. |

04-197

## ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය මහෙස්ත්‍රාත් අධිකරණය - අනුරාධපුර

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හිමිකම් නොපාන ලද නඩු අංක මැකී ඇති නඩු වාර්තා සොයා ගැනීමට අපහසු භාණ්ඩවල අංක මැකී ඇති පහත සඳහන් භාණ්ඩ 2017.04.29 වැනි දින පෙ. ව. 10.00 ට අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

4. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ එවෙලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු බවත්, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

6. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැණුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

7. වෙන්දේසිය පිළිබඳව පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන්වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

8. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බවද වැඩිදුරටත් සඳහන් කරමි.

කේ. පී. එස්. හර්ෂන්,
මහෙස්ත්‍රාත් /අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අනුරාධපුර.

2017 මාර්තු මස 10 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ ලැයිස්තුව

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 1. | 44421 | කැති 07 යි |
| 2. | 61469 | කැති 01 යි |
| 3. | 61467 | කැති 01 යි |
| 4. | 61466 | කැති 01 යි |
| 5. | 57290 | කැති 01 යි |
| 6. | 51689 | කැති 01 යි |
| 7. | 57291 | කැති 01 යි |
| 8. | 61465 | කැති 01 යි |
| 9. | 56209 | කැති 01 යි |
| 10. | 45209 | කැති 01 යි |
| 11. | 45540 | කැති 01 යි |
| 12. | 46845 | කැති 01 යි |
| 13. | 46844 | කැති 01 යි |
| 14. | 46842 | කැති 01 යි |
| 15. | 46132 | කැති 01 යි |
| 16. | 42185 | කැති 01 යි |
| 17. | 45539 | කැති 01 යි |
| 18. | 42187 | කැති 01 යි |
| 19. | 56208 | කැති 01 යි |
| 20. | 56210 | කැති 01 යි |
| 21. | 40179 | කැති 01 යි |
| 22. | 56640 | කැති 01 යි |
| 23. | 47640 | කැති 01 යි |
| 24. | 56603 | කැති 01 යි |
| 25. | 72396 | කැති 01 යි |
| 26. | 62712 | කැති 02 යි |
| 27. | 72175 | කැති 04 යි |
| 28. | 57303 | කැති 01 යි |
| 29. | 60495 | කැති 01 යි |
| 30. | 85780 | කැති 01 යි |
| 31. | 85514 | කැති 01 යි |
| 32. | 72643 | කැති 01 යි |
| 33. | 85514 | කැති 01 යි |
| 34. | 85504 | කැති 02 යි |
| 35. | 73717 | කැති 01 යි |
| 36. | 88922 | කැති 01 යි |
| 37. | 90450 | කැති 01 යි |
| 38. | 78565 | කැති 01යි, පොරොව 01යි |
| 39. | 57733 | පොරොව 01යි |
| 40. | 46647 | පොරොව 01යි |
| 41. | 42186 | පොරොව 01යි |
| 42. | 47375 | පොරොව 01යි |
| 43. | 72395 | පොරොව 01යි |
| 44. | 38905 | පොරොව 01යි |
| 45. | 80640 | පොරොව 01යි |
| 46. | 82848 | සවල් 01යි |
| 47. | 62714 | සවල් 01යි |
| 48. | 57081 | සවල් 01යි |
| 49. | 72713 | සවල් 01යි |
| 50. | 65736 | සවල් 01යි |
| 51. | 70541 | සවල් 01යි |
| 52. | 77662 | සවල් 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 53. | 78486 | සවල් 01යි |
| 54. | 78503 | සවල් 01යි |
| 55. | 83941 | සවල් 01යි |
| 56. | 84680 | සවල් 01යි |
| 57. | 90823 | සවල් 01යි, උදලු 01යි, යකඩ බාල්දි 01යි |
| 58. | 62449 | උදලු 01යි |
| 59. | 62905 | උදලු 01යි |
| 60. | 84666 | උදලු 01යි, තාච්චි 01යි |
| 61. | 88831 | පිහිය 01යි |
| 62. | 88695 | ඇලුමිනියම් මුට්ටි 01යි, ඇලුමිනියම් තාච්චි 01යි |
| 63. | 90822 | ඇලුමිනියම් කළ 01යි |
| 64. | 84552 | විදුලි පන්දම් 01යි |
| 65. | 84551 | විදුලි පන්දම් 01යි |
| 66. | 83011 | විදුලි පන්දම් 01යි |
| 67. | 85534 | විදුලි පන්දම් 01යි |
| 68. | 88046 | විදුලි පන්දම් 01යි |
| 69. | 85536 | විදුලි බේකර් 01යි |
| 70. | 88040 | විදුලි බේකර් 01යි |
| 71. | 84375 | විදුලි බේකර් 01යි |
| 72. | 89267 | විදුලි බේකර් 01යි |
| 73. | 87466 | දුරකථන චාජර් 01යි |
| 74. | 86064 | දුරකථන චාජර් 01යි |
| 75. | 89269 | දුරකථන චාජර් 01යි |
| 76. | 84547 | දුරකථන චාජර් 01යි |
| 77. | 89601 | වයර් කෝඩ් 01යි |
| 78. | 90475 | 12.5 Kg Litro වර්ගයේ ගෑස් සිලින්ඩර් 01යි, ගෑස් ලිප් 01යි |
| 79. | 83363 | Nokia වර්ගයේ ජංගම දුරකථන 01යි |
| 80. | A 1208/16 | ETEL වර්ගයේ ජංගම දුරකථන 01 යි |
| 81. | B 2596/04 | පාපැදි 01 යි |
| 82. | B 351/05 | පාපැදි 01 යි |
| 83. | B 2867/05 | පාපැදි 01 යි |
| 84. | B 3159/05 | පාපැදි 01 යි |
| 85. | B 1493/06 | පාපැදි 01 යි |
| 86. | B 958/06 | පාපැදි 01 යි |
| 87. | B 2112/06 | පාපැදි 01 යි |
| 88. | B 2038/06 | පාපැදි 01 යි |
| 89. | B 1337/06 | පාපැදි 01 යි |
| 90. | B 2608/07 | පාපැදි 03 යි |
| 91. | B 2368/07 | පාපැදි 01 යි |
| 92. | B 2039/07 | පාපැදි 01 යි |
| 93. | B 2045/07 | පාපැදි 01 යි |
| 94. | B 3102/07 | පාපැදි 01 යි |
| 95. | B 2214/07 | පාපැදි 01 යි |
| 96. | B 3040/07 | පාපැදි 01 යි |
| 97. | B 1282/08 | පාපැදි 01 යි |
| 98. | B 470/09 | පාපැදි 01 යි |
| 99. | B 2176/09 | පාපැදි 01 යි |
| 100. | B 331/09 | පාපැදි 01 යි |
| 101. | B 2884/03 | පාපැදි 01 යි |
| 102. | B 473/09 | පාපැදි 01 යි |
| 103. | 37130 | පාපැදි 03 යි |
| 104. | - | විවිධ ප්‍රමාණයේ හිස් ප්ලාස්ටික් බූලි 75ක් පමණ |
| 105. | - | විවිධ ප්‍රමාණයේ හිස් වීදුරු බෝතල් 500ක් පමණ |
| 106. | - | විවිධ ප්‍රමාණයේ හිස් යකඩ බැරල් 20ක් පමණ |
| 107. | 75023 | සවල් 01යි, පොරෝ 02යි, එල්ලෙන තරාදි 01යි , ප්ලාස්ටික් බැරල් 03යි |
| 108. | B 1102/07 | 31 ශ්‍රී 1371 දරන ජීප් රථය |
| 109. | B 1982/07 | ලි. ප. අංක රහිත Bajaj Pulser යතුරුපැදිය |
| 110. | B 1145/07 | ලි. ප. අංක MV 3161 දරන Bajaj CT 100 යතුරුපැදිය |
| 111. | B 2555/06 | ලි. ප. අංක 159-0598 දරන Yamaha යතුරු පැදිය |
| 112. | B 1130/08 | ලි. ප. අංක GF 6482 දරන Honda යතුරු පැදිය |
| 113. | B 2554/09 | ලි. ප. අංක JV - 3699 දරන Bajaj CT 100 යතුරු පැදිය |
| 114. | B 1336/09 | ලි. ප. අංක TS 6900 දරන Hero Honda යතුරු පැදිය |
| 115. | B 109/09 | ලි. ප. අංක TU 5101 දරන Hero Honda යතුරු පැදිය |
| 116. | B 3490/09 | ලි. ප. අංක JV - 3674 දරන Bajaj Discover යතුරු පැදිය |
| 117. | A 1142/09 | ලි. ප. අංක 132-6140 දරන Honda යතුරු පැදිය |
| 118. | A 574/08 | ලි. ප. අංක රහිත යතුරු පැදිය |
| 119. | A 1246/09 | ලි. ප. අංක 124-9359 දරන Yamaha Mate 50 යතුරු පැදිය |
| 120. | - | ලි. ප. අංක WC - 4248 දරන Bajaj Pulsar යතුරු පැදිය |
| 121. | 55267 | ලි. ප. අංක රහිත Singer Safari යතුරු පැදිය |
| 122. | 74879 | ලි. ප. අංක රහිත Kawasaki Baligo යතුරු පැදිය |
| 123. | B 1805/10 | ලි. ප. අංක 117-0956 දරන Yamaha Mate 50 යතුරු පැදිය |
| 124. | 45844 | ලි. ප. අංක 121- 2100 දරන Honda යතුරු පැදිය |
| 125. | B 545/08 | ලි. ප. අංක GL-6280 දරන Bajaj ත්‍රිරෝද රථය |
| 126. | 30858 | ලි. ප. අංක 41 ශ්‍රී 1394 දරන Isuzu ලොරි රථය |

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

2017 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2017 මැයි මස 01 වැනි දින සිට 2017 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති, කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද, දැනට බල පවත්නා සියලුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් ව 2017.04.28 වැනි දින පෙ.ව. 10.00 දක්වා ම විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය, ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද (අදාළ ටෙන්ඩරයේ සඳහන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක්) සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාරගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන්, කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2017.04.28 වැනි දින පෙ.ව. 10.00 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

කේ. ජී. එච්. එච්. ආර්. කිරිඇල්ල,
ප්‍රාදේශීය ලේකම්,
කටාන.

2017 මාර්තු මස 22 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|
| මූකලන්ගමුව අංක 13 | කටාන | මූකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 4,000 | 2017.04.28<br>පෙ.ව. 10.00 |

04-100

## වාකරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වාකරේ සහ මාංකාඩූ - මඩකලපුව දිස්ත්‍රික්කය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2017 ජූලි 2018 ජූනි

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධාන අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ මාංකාඩූ රා තැබෑරුම් සඳහා 2017 ජූලි මස 01 වැනි දින සිට 2018 ජූනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මන්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි දකුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සිය (රු. 1,500) ක මුදලක් වාකරේ ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබාගත හැකි ය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2017.04.24 දින සිට 2017.05.05 වැනි දින පස්වරු 3.00 දක්වා.

02. ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% ට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් පත්‍ර සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබාගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කරන ලද දින සිට සති දෙකක් ඇතුලත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික නොමැත.

06. ලියාපදිංචි කළ පොල් සහ තල් සමුපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

ආර්. රාහුලනායගි,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>
මණ්මුනයි දකුණ එරුවිල් පත්තු.

2017 මාර්තු මස 17 වැනි දින,

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය* | *වේලාව* |
|---|---|---|---|---|
| කෝරලේපත්තු උතුර | පාල්සේනෛ | TT No. 5 | 2017.05.30 | ප. ව. 2.00ට |

*සටහන* .- 1. ටෙන්ඩර් මණ්ඩල 2017.05.30 වැනි දින පස්වරු 2.00 ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බඳුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2017.06.16 වැනි දින පස්වරු 2.00 ට පැවැත්වේ.

04-116

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව දැන්වීම

කොළඹ 15, මෝදර, මුතුවැල්ල මාවත, අංක 242/23/D හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 831520400 V දරන රාජමුනිදුගේ නිරන්ජන් ඩේවි වන මම ලක්ෂ්මී සී. සූරිගේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2017.02.27 වැනි දින සහතික කරන ලද අංක 8773 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් තලපත්පිටිය, පන්සල පාර, අංක 445/1A හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 782300342 V දරන හතුරුසිංහගේ රුවන් ඉන්දික ජයරත්න යන අයට මා වෙනුවෙන් ක්‍රියා කිරීමේ දී තිබූ ඇටෝර්නි බලය 2017.03.14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් එම ඇටෝර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිම ක්‍රියාවකට මා විසින් වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ආර්. නිරන්ජන් ඩේවි.

04-04

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

රත්මලාන, ශ්‍රී ජිනරතන මාවත, අංක 8/4 හි පදිංචි සුනේත්‍රා පෙරේරා (ජා. හැ. අංක 456412890 V) සහ ෂෙහානි රද්දල්ගොඩ (ජා. හැ. අංක 736150816 V) වන අප ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ පොදු ජනතාවට මෙයින් දැනුම් දෙනු ලබන්නේ රත්මලාන, 5 වන පටුමග, අංක 17 හි පදිංචි නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් රේණුකා එම්. එදිරිසිංහ විසින් 2013 දෙසැම්බර් මස 30 වැනි දින ලියා සහතික කරන ලද අංක 2353 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් මාලඹේ, මිහිඳු මාවතේ, 9 වැනි පටුමග, අංක 559/4C හි පදිංචි ජානකී කහඳලියනගේ (ජානකී වීරසිංහ) (ජා. හැ. අංක 497592267 V) යන අය අපගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කරන ලද එකී ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත් මින්මතුවට එහි නෛතික බලපැවැත්මක් නොමැති බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සුනේත්‍රා පෙරේරා,
ෂෙහානි රද්දල්ගොඩ.

04-13

---

## ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 06 වන දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඩ්‍රීම් වර්ල්ඩ් ට්‍රෙඩෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 120594
ලියාපදිංචි කල දිනය : 2017.03.06
ලියාපදිංචි කළ ලිපිනය : 17/A, පොලිස් ස්ථානය ඉදිරියෙහි වූ, මඩකලපුව පාර, පොළොන්නරුව.

04-15

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : හෙම් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 120650
ලියාපදිංචි කාර්යාලය : අංක 65, මීගහවත්ත, සියඹලාපේ
ලියාපදිංචි කළ දිනය : 2017.03.08

සමාගමේ ලේකම්වරු.

04-23

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : පතිරණ ලෙන්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 85948,
දිනය : 2012.06.15
ලිපිනය : අංක 21, තිස්ස මාවත, කුලියාපිටිය.

කළමනාකරු.

04-29

---

## නිවේදනයයි

එලිමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (ලියාපදිංචි අංක පී වී 60012) සමාගම විසින් 2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වන වගන්තියට අනුකූලව සහ සමාගමේ කොටස් හිමියන් වෙත ඉදිරිපත් කිරීමට නියමිත යෝජනා සම්මතයට යටත්ව, සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය පහත සඳහන් පරිදි අවකරණය කිරීමට යෝජිත බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රකාශිත ප්‍රාග්ධනය අවකරණය කිරීම : රු. 140,476,706.86 සිට රු. 103,649,275.86 දක්වා
අධ්‍යක්ෂක මණ්ඩල යෝජනා සම්මත දිනය : 2016.11.24
සමාගම් කොටස් හිමියන්ගේ ලිඛිත යෝජනාවට නියමිත දිනය : 2017.03.31

එලිමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 22/2 - 1-1,
පෙරේරා මාවත, කළුබෝවිල,
දෙහිවල.

04-40

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියට අනුව පහත දක්වෙන ආයතන සීමාසහිත සමාගම් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නාමය : ඒ යූ එන්ටර්ටේන්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : අංක 112, රෝහල පාර, කළුබෝවිල, දෙහිවල
ලියාපදිංචි අංකය : PV 119844,
ලියාපදිංචි දිනය : 2017.02.03

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-51

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : හයි ක්ලෝතින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 120915
ලියාපදිංචි කාර්යාල ලිපිනය : කිරිබත්ගල එස්ටේට්,
නිවිතිගල පාර, දැල, රත්නපුර.
සංස්ථාගත කළ දිනය : 2017.03.20

මොහොමඩ් ඉස්මයිල් ෆයිසාල්,
සමාගමේ ලේකම්.

04-52

## විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 47, තිඹිරිගස්යාය පාර, කොළඹ 05 ලිපිනයේ පදිංචි ෆසල් මොහමඩ් අදාම් (ජාතික හැඳුනුම්පත් අංක 542141972 V) හනියා බිස්රි අදාම් (ජාතික හැඳුනුම්පත් අංක 585090174 X), ෆාතිමා ෂිරා අදාම් (ජාතික හැඳුනුම්පත් අංක 625240476V) වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් සුනේත්‍රා යූ. ආර්. වනිගසේකර විසින් ලියා සහතික කරන ලද අංක 4270 සහ 2005 නොවැම්බර් 11 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් අංක 32/2B, රුබෝට් උද්‍යානය, දෙහිවල දරන තැන පදිංචි නූර් මොහමඩ් මොහමඩ් ඉක්රම් (ජාතික හැඳුනුම්පත් අංක 552383192V) යන අය වෙත ලබා දී තිබූ විශේෂ ඇටෝර්නි බලය 2017.03.15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරන අතර, එදිනට පසුව ඔහු විසින් එම විශේෂ ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන කිසිම ක්‍රියාවකට අප විසින් වග නොකියන බවටත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ෆසල් මොහමඩ් අදාම්,
හනියා බිස්රි අදාම්,
ෆාතිමා ෂිරා අදාම්.

04-66

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නාමය : විෂ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 120657
ලියාපදිංචි ලිපිනය : අංක 160/285 A, වැව පාර, පැලවත්ත,
තලංගම දකුණ.

සමාගම් ලේකම්.

04-75

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි.

නම : සෙරෙන්යා රීච් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 119513
දිනය : 2017.01.20
ලිපිනය : අංක 70/47, ශ්‍රී සිද්ධාර්ථ පාර, කිරුළපන, කොළඹ 05.

සමාගම් ලේකම්වරු.

04-82

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඩී ඇන්ඩ් එස් කොමර්ෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 120639
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 400, රිවර්සයිඩ් වතුයාය,
ගලහ පාර, පේරාදෙනිය
ලියාපදිංචි දිනය : 2017.03.07

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

04-88

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ෆෝ ඒසස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 120575
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 498/4, හයිලෙවල් පාර, පන්නිපිටිය
ලියාපදිංචි දිනය : 2017.03.06

ඉහත සඳහන් සමාගම් හි ලේකම්වරු.

04-87

---

### ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කුණ්ඩසාලේ හේන්වල අංක 12/3 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 640421460 V දරන ප්‍රියානි දේවිකා ජයලත්, මහනුවර, දෙඩන්වල, ශ්‍රීමත් කුඩාරත්වත්ත මාවත, අංක 224 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 610574084 V දරන ජයලත්ගේ උපාලි ප්‍රියන්ත කුමාර ජයලත් හෙවත් උපාලි ප්‍රියන්ත කුමාර ජයලත් සහ මහනුවර ශ්‍රී ධම්මදස්සී මාවත අංක 44/11 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 587042754 V දරන රම්‍ය ශාන්ති කුමාරි ජයලත් වන අප විසින් අත්සන් කරන ලද සහ අපගේ ඇටර්නි බලකරු වශයෙන් බත්තරමුල්ල පන්නිපිටිය පාර අංක 1060 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටුවා ඇති හෝම් ලෑන්ඩ්ස් හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම පත් කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් චන්න සී මිල්ලවිතානච්චි සහතික කරන ලද 2015 සැප්තැම්බර් මස 3 වැනි දින සහ අංක 2122 දරන ඇටර්නි බලපත්‍රය වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයි ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටද එහි සියලුම මහජනයාට ද මෙයින් දන්වා සිටිමු.

04-98

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : පියෝ ග්‍රීන් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119522
ලියාපදිංචි ලිපිනය : අංක 3/106, ගැමුණුපුර 1 වන පටුමග, කොතලාවල, කඩුවෙල

අධ්‍යක්ෂකවරු.

04-108

---

### වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන ඡේදය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ඒ එම් ටී මාකටිං ඇන්ඩ් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 80761
දිනය : 2011 අගෝස්තු මස 19
සමාගමේ ලිපිනය : අංක 230 සහ 232, වුල්ෆෙන්ඩාල් වීදිය, කොළඹ 13.

අප්පුකුඩ්ඩි මුරුගේසු තානානයගම්,
අධ්‍යක්ෂ.

04-115

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතට අනුව පහත සඳහන් සමාගම 2017 මාර්තු 14 වැනි දින සංස්ථාගත කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සීෆෝස් ෆර්ටිලයිසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 120803
ලියාපදිංචි ලිපිනය : අංක 9/5, තඹයියා ඇවනිව්, කොළඹ 07

ජේසී ඇන්ඩ් කොම්පැනි,
සමාගම් ලේකම්වරු.

අංක 9/5, තඹයියා ඇවනිව්,
කොළඹ 07.

04-118

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

හික්කඩුව, දහනායකගොඩ වත්ත, කන්ද උඩ පාර, 43/5 පදිංචි රණසිංහ වීරක්කොඩි ලීලාවතී වන මා විසින්, හික්කඩුව, වවුලාගොඩ පදිංචි චන්ද්‍රසේන ගොන්සල්කෝරාළ යන අය වෙත බලය පවරමින්, ප්‍රසිද්ධ නොතාරිස් රංජනී ඊ කළුපහන මහත්මිය විසින් වර්ෂ 2012.02.17 වැනි දින ලියා සහතික කරන ලද අංක 23287 දරන ඇටර්නි බලපත්‍රය 2017.02.16 දින සිට අවලංගු කරන බවත්, එකී ඇටර්නි බලකරු ලෙස සිදුකරන කිසිදු ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙමි.

රණසිංහ වීරක්කොඩි ලීලාවතී.

04-120

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2017 මාර්තු මස 17 වැනි දින සංස්ථාගත කරන ලදී.

